# පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
# බස්නාහිර පළාත
## மாகாணசுகாதாரசேவைகள்பணிப்பாளர் அலுவலகம்
## மேல் மாகாணம்
## OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES
## WESTERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WP/PD/ES/5/PHY/වාර්ෂික ස්ථාන මාරු/ 2026 | ඔබේ අංකය / உமது இல / Your No. | |
| දිනය / திகதி / Date | 2026.06.19 | | |

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කොළඹ / ගම්පහ / කළුතර.

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හෞත චිකිත්සක නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**
**<u>සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම</u>**

බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු හෞත චිකිත්සක නිලධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධ සමාලෝචන කමිටු තීරණ ඇමුණුම මඟින් ඔබ වෙත යොමු කරමි.මෙමඟින් කරන ලද සංශෝධනයන්ට යටත්ව හෞත චිකිත්සක නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2026.04.20 දිනැති ලිපිය මඟින් යෝජිත 2026 වර්ෂයට අදාළ ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

- **ස්ථාන මාරු සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධාරීන්ට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 239 හා 263 වගන්තිවල විධිවිධානවලට අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.**
- **ඉදිරිපත් කරනු ලබන අභියාචනයන් සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ දින සිට දින 14ක් ඇතුළත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුයි.**

02. ඒ අනුව, 2026 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි වෙනස්කම්වලට යටත්ව, ස්ථාන මාරු නියෝගවලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක විය යුතු අතර එසේ ස්ථාන මාරු නියෝග ඉදිරියෙන් සඳහන් කර නොමැති නම් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයා පැමිණෙන තුරු නොසිට වාර්ෂික ස්ථාන මාරු **<u>2026.08.01දින සිට ක්‍රියාත්මක සේ සලකා</u>** වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද හෞත චිකිත්සක නිලධාරීන් තම ආයතනයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි මුදා හැරිය යුතු අතර, නියමිත රාජකාරී ආවරණය කිරීමට තාවකාලික වැඩපිළිවෙලක් අභ්‍යන්තර වශයෙන් යොදා ගැනීමට ආයතන ප්‍රධානියා විසින් ක්‍රියා කළ යුතු බව දන්වමි.

03. එසේම, මෙම ස්ථාන මාරු ලැයිස්තුව බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ <u>www.pdhswp.org</u> දරණ වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකි බව ද වැඩි දුරටත් දන්වමි.

විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(රා.ආ),
බස්නාහිර පළාත

පිටපත් :
1. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.) - කා.දැ.ගැ.පි.
2. ලේකම් - රජයේ හෞත චිකිත්සකවේදීන්ගේ සංගමය - කා.දැ.ගැ.පි.
3. තොරතුරු තාක්ෂණ අංශය – ප.සෞ.සේ.අ.කාර්යාලය (බ.ප.) - වෙබ් අඩවියේ පල කිරීම සඳහා


| | කාර්යාලය அலுவலகம் Office | පළාත් අධ්‍යක්ෂ மாகாணபணிப்பாளர்Provincial Director | සැලසුම් අංශය திட்டக்கூறு Planning Unit | නි.අධ්‍යක්ෂ(පාලන) பிரதிபணிப்பாளர் (நிர்வாகம்) Deputy Director(Admin) | ප්‍රධාන ගණකාධිකාරී கணக்காளர் Chief Accountant | පරිපාලන නිලධාරී நிர்வாக அதிகாரி Adm. Officer |
|---|---|---|---|---|---|---|
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk |

මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,තැ.පෙ.876,කොළඹ10 மாளிகாவத்தை செயலகம்,த.பெ.இல.876,கொழும்பு 10 Maligawatta Secretariat Building, P.O. Box 876, Colombo 10.
www.healthdept.wp.gov.lk



Scanned with CamScanner

**වාර්ෂික ස්ථානමාරු 2026 - භෞත චිකිත්සක**

**සමාලෝචන කමිටු තීරණ කොළඹ දිස්ත්‍රික්කය**

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු කල සේවා ස්ථානය | සමාලෝචන කමිටු තීරණ |
|---|---|---|---|---|
| 1 | එස්.එච්.කස්තුරිආරච්චි මයා | අවිස්සාවේල්ල මූලික රෝහල | හෝමාගම මූලික රෝහල | අභියාචනයේ සදහන් කරුණු සළකා බලා 2027 වාර්ෂික ස්ථාන මාරු වලට යටත්ව ස්ථාන මාරුව අවලංගු වේ. |
| 2 | එස්.එස්.ආටිගල මිය | හෝමාගම මූලික රෝහල | අවිස්සාවේල්ල මූලික රෝහල | අභියාචනයේ සදහන් කරුණු සළකා බලා ස්ථාන මාරුව අවලංගු කෙරේ. |

විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක
එම්.බී.බී.එස්,එම්.ඒ.එම්.එස්.සී.,එම්ඩී
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (රා.ආ)
බස්නාහිර පළාත

Scanned with CamScanner

**වාර්ෂික ස්ථානමාරු 2026 - භෞත චිකිත්සක**

**සමාලෝචන කමිටු තීරණ කළුතර දිස්ත්‍රික්කය**

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු කල සේවා ස්ථානය | සමාලෝචන කමිටු තීරණ |
|---|---|---|---|---|
| 1 | ජේ.එම්.වයි.ආර්.හේරත් මිය | දිස්ත්‍රික් මහ රෝහල-හොරණ | මූලික රෝහල - පානදුර | අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මකයි |

විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක
එම්.බී.බී.එස්,එම්.ඒ.එම්.එස්.සී.,එම්ඩී
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (රා.ආ)
බස්නාහිර පළාත

Scanned with CamScanner